## ජීවත්ව සිටියදී අගය කළ යුතු චරිත

# පොදු ජනතාවට ගී ගයන නිහාල් නෙල්සන්....

### චන්දන ගුණසේකර එංගලන්තයේ සිට .....

ඒ හැත්තෑව දශකයේ අග භාගයයි. සිංහල සිනමාවේ සහ සංගීතයේ ස්වර්ණමය යුගයයි. සමාජ, දේශපාලන සහ සංස්කෘති යේ හැරවුම් ලක්ෂයක ඇරඹුමයි. එතෙක් කලක් ලද දෙයින් සතුටු වී අත් හැරීම ප්‍රගුණ කොට වුන් බහුතරයක් රට වැසියන්ගේ තිබූ ඒ අධ්‍යාත්මික ගුණයට කණ කොකා හැඩූ වකවානුවයි. විවෘත ආර්ථිකයත් සමඟ රටට රිංගා ගත් බල්ලො මරා හෝ සල්ලි සෙවීමේ න්‍යයය , ත්‍රස්තවාදය සහ සිවිල් යුද්ධය ඇරඹීම අබිමුව අප බලාගෙන වුන් තීරණාත්මක කාලයයි.

එකල සිනමාව පැත්තෙන් ගතහොත් උදේ 10.30 ට පටන් ගත් දර්ශන වාරය, ඉන්පසු 2.30 , 6.30 හා 9.30 ද වශයෙන් දර්ශන වාර 4ක් ඉතාමත්ම සාර්ථකව හා ප්‍රේක්ෂකයන්ගෙන් පිරී ඉතිරී යන අන්දමින් පැවැත්වීම දෛනික කාර්යයක් විය. අද ඒ පිළිබඳව සිතද්දී පවා මුවට නැගෙන්නේ සතුටු සිනහවකි. එපමණක්ද ඒ සමඟ බැඳුණු රාත්‍රී ආපන ශාලා, රාත්‍රී බස් සේවා රටේ නගරවල පමණක් නොව හද්දා පිටිසර ගම්වල පවා දක්නට ලැබිණි. රාත්‍රියේ සිනමා පටයක් නරඹා තරුණයකුට කිසිදු අන්තරාවක් නැතිව සිය නිවසට යා හැකි වාතාවරණයක් එකල පැවතිණි. රාත්‍රියේ මුර සංචාරයේ යෙදුණු පොලිස් කණ්ඩායම් ඉඳහිටක ප්‍රශ්න කිරීමකට නතර කළද එය හුදෙක් ආරක්ෂක පියවරක් විනා ජීවිතයට තර්ජනයක් වූයේ නැත.

රාත්‍රියේ මළ ගෙවල් වල නිදහසේ හැසි රෙන තරුණයන් සහ සෑම මසකම පාහේ එළිමහන් වේදිකාවල පැවැත්වූ සංගීත සන්ද්‍යාවන්ට යන එන යෞවන යෞවනියන් රාත්‍රියේ මංමාවත් වල දකින්නට ලැබීම ඉතාමත්ම සුලභ දසුන් විය.

මා මේ කියන්නට යන කථාවේ කතා නායකයාව මට මුල් වරට හැබැහින් දැක ගන්නට ලැබුණේද එලෙසින් මා නරඹන්නට ගිය සංගීත සංදර්ශනයකිනි. එකල වයස අවුරුදු 10 ක පමණ වූ කොට කලිසම අඳින පුංචි කොලූ ගැටයෙකු වූ මම, තාත්තා සමඟ සිනමාපට නැරඹීමට සහ සංගීත සංදර්ශන නැරඹීමට නොවරදවාම ගියෙමි. මා මෙන්ම තාත්තාද චිත්‍රපට සහ සිංදු පිස්සකු වීම , මගේ මේ ගමන් ඉතාමත්ම පහසුවෙන් ඉෂ්ට සිද්ධ කර ගැනීම සඳහා මට ලැබුණු වෙස්වලාගත් ආශීර්වාදයක්ම විය.

එකල, ලංකා දුම්කොළ සමාගම අනුග්‍රහයෙන් පැවැත්වූ සංගීත සංදර්ශන අවම වශයෙන් 3ක් වත් වසරකට අනුරාධපුර නගරයේ පැවැත්වුණි. ඒවා බොහෝවිට පැවැත්වුණේ අනුරාධපුර ටවුමේ පිහිටි සල්ගාදු පිටියට යාබද , මහජන ක්‍රීඩාංගණයේය.



එදා, මා මේ කියන දිනයේත් සංගීත සංදර්ශනය පැවතියේ මහජන ක්‍රීඩාංගණයේම වූ අතර බෝම්බ බියක් ගැන හෝ ත්‍රස්තවාදයක් ගැන හෝ හාංකවිසියක නිනව්වක් නැතිවූ ඒ සාමකාමී යුගයේ, එහි රැස්වූ දහස් ගණනක් සංගීත ලෝලීන් මධ්‍යයේ තෙරපෙමින්, තාත්තාගේ අත තරයේ බදාගෙන පුංචි මමද තාත්තා පිටුපසින්ම වේදිකාව අසලටම රිංගා ගත්තේ ඉහින් කණින් දහඩිය පෙරාගෙන මහා යුද්ධයක් ජයගත් යුඳ සෙබළුන් දෙදෙනකු පරිද්දෙනි. එකල අද මෙන් වේදිකාව වටා ලුණු ඇද රසිකයන් හා සංගීත ශිල්පීන් අතර පරතරයක් නිර්මාණය කර නොතිබිණි. එමෙන්ම ලොකු ලොක්කන්ට ඉදිරියෙන්ම ආසන පනවා තිබූ බවක්ද මගේ මතකයේ නැත. අප වේදිකාව අසලටම ගොස් බිම වාඩි වී සංගීතය නැරඹූ බව පමණක් මගේ මතකයේ ඇත.

එදා බොහෝ ගායක ගායිකාවන් පිරිසක් ගී ගැයීමට පැමිණ සිටියහ. ඒ අතුරින් ටී එම් ජයරත්න, මොහිදින් බෙග්, එච් ආර් ජෝතිපාල, වික්ටර් රත්නායක, ෆ්‍රෙඩී සිල්වා, එම් එස් ප්‍රනාන්දු , ඇන්ටන් ජෝන්ස්, ලුක් හෙන්රිකස්, සිසිර හා ඉන්ද්‍රානි යුවළ, සනත් නන්දසිරි යුවළ සහ ත්‍යාගා එන් එඩ්වඩ් යන ගායක ගායිකාවන් ගී ගැයූ අන්දම මට හොඳින්ම මතකයේ ඇත. මංගල ප්‍රේමදාස නම් ශිල්පියෙකු කටින් එක් එක් ශබ්ද කළ බවද තවත් නර්තන ශිල්පියෙක් ගිනි නැටුමක් කළ බවද මතකය. එකල අද මෙන් එක් එක් ශිල්පියාට එක් එක් ව්‍යාපාරික ආයතන මඟින් අනුග්‍රහ දැක්වූයේ නැති අතර ගීතවලට රංගනයෙන් දායක වන නර්තන ශිල්පිණියන්ද සිටියේ නැත.

මේ අතර බෙග් මාස්ටර් ඉතා විශාල කොළ මිටියක් රැගෙන විත් ගී ගැයූ අන්දමද මිල්ටන් මල්ලවආරච්චි ගායනවේදියා කිසිදු සෙලවීමක් නොමැතිව හිටි පිළිමයක් සේ වේදිකාව මතට වී ගී ගැයූ අන්දමද මට හොඳින්ම මතකය.

මේ අතර වේදිකාවට අවතීර්ණ වූ, එකල ඉතාම ජනප්‍රිය විලාසිතාවක් වූ බෙල්බොටමයක් ඇඳ කමිසය යට කර, ඉතා ඝනට වැඩුණු තරමක් දිග කොණ්ඩයක්ද හිමි තරුණ ගායන ශිල්පියෙකි. ඔහු එක තැනක එක මොහොතක් වත් නොසිටියේය. වේදිකාවේ හැම අතටම ඉස්සකු මෙන් පනිමින්ද, තමන්ටම ආවේණික වූ රංගයක යෙදෙන ගමන් මයික්‍රෆෝනය ඒ අතින් මේ අතට වීසි කරමින්ද ඉතාමත්ම හුරු බුහුටි හඬකින් ඔහු වේග රිද්මයේ ගීත ගැයීය. ඔහු එදා ගී ගැයීම ඇරඹුවේ ලස්සනට පිපුණු වන මල් යන ගීතයෙනි. එකල ගුවන් විදුලියේ ප්‍රචාරය වූ ඉතාමත්ම ජනප්‍රිය ගීතයක් වූ එය මා රේඩියෝවෙන් කිහිප විටක් අසා තිබුණද එය ගැයූ ගායකයාව හැබැහින් දැක්කේ එදාය. ඔහු වෙන කවුරුන් හෝ නොව මෙම ලිපියේ කතා නායක නිහාල් නෙල්සන් නම් වූ ගායනවේදියාය.

එතුමා ඉන්පසු ගැයූ සොමියට වරෙන් පුතා අගුල දාලා නෑ දොරේ ගීතයට මුලූ ප්‍රේක්ෂක ජනතාවම රංගනයෙන් දායක වූ බව මට මතකය. තවත් ගීත කිහිපයක් ගැයූ මුත් මට ඒවායේ නම් හරියටම මතක නැත. එහෙත් ගී ගැයුම අතර තුරදී සිදුවූ එක් සිද්ධියක් නම් ගලේ කෙටූ අකුරු මෙන් මගේ මතක ගබඩාවේ තැන්පත්ව ඇත. ඇත්තම කියනවා නම් මම ඒ සිදුවන්නේ කුමක්දැයි සිතා බියටද පත් වූයෙමි.

ඒ සිද්ධිය නම් මෙසේයි. මයික්‍රෆෝනය අතින් අතට විසි කරමින් එතුමා ගී ගයන අතර හදිසියේ කට හඬ නැතිව වාදනය පමණක් ඇති මොහොතේ එතුමා අතින් සංඥාවක් කළේය. එවිට ඩ්‍රම්ස් වාදකයා හැර අනෙකුත් සියලූම වාද්‍ය ශිල්පීන් තම සංගීත ආම්පන්න වැයීම නතර කළ අතර, ඩ්‍රම්ස් වාදකයා තමා දන්නා සියලුම ශිල්ප පෙන්වමින් තනිවම විනාඩි 5ක් පමණ ඩ්‍රම්ස් වාදනයේ නිරත විය. මම බිය වූයේ ඩ්‍රම්ස් වාදකයා මායම් වූවාදැයි සිතීමෙනි. මට යන්තමට මතක හැටියට මෙය සිදුවූයේ තාන් තීන් තිනක නඳින්, කොහොඹ කළේ උකුළෙ තියන් යන කාවඩි නැටුම් සංගීතයට ගැයූ ගීතය අතරතුරේදීය. එමෙන්ම එතුමා තවත් වරෙක ගිතාරු වාද්‍යශිල්පියා ළඟටම ගොස් හිටගෙන ඔහුටත් මනරම් ගිතාරු වාදනයක් ඉදිරිපත් කිරීමට ඉඩ පහසුව සලසා දුන්නේය. එපමණක් නොව ගීත ගැයීමට පෙර තමන්ව හඳුන්වා දුන් නිවේදක මහතාට සහ ගීත ගැයීමෙන් අනතුරුව වාද්‍ය කණ්ඩායමටත් ස්තූති කිරීමටද එතුමන් අමතක නොකළේය.

ඉන්පසුව අසූව දශකයේදී ඇරඹුණු කැසට් පටි යුගයේදී එතුමන්ගේ කැසට් පටියක් තරංගා ලේබලය යටතේ ලංකාවේ දෙවන කැසට් පටය විලසින් වෙළඳ පොළට එක් විය. එහි නම වූයේ හේමසිරි හල්පිට ලියූ ඒ අති ජනප්‍රිය ගීතය වූ ගුණෙ අයියගෙ කාමරේ යන්නයි. ඉන්පසු ජනප්‍රියතාවයේ හිණි පෙත්තටම නැංග නිහාල් නෙල්සන් නොමැති ප්‍රසංග වේදිකාවක් හරියට දෙවියන් නොමැති දේවාලයක් මෙන් විය. පැණි නැති මලක් මෙන් විය.

කැසට් පටි සියයකට වඩා නිකුත් කළ එතුමන් ලංකාවේ වැඩිම කැසට් පටි ප්‍රමාණයක් නිර්මාණය කළ ගායකයා

19 වන පිටට

සන්නස SANNASA CARTOON By PK




**MATHEMATICS**

- Selective Schools (Mac Rob, Mel High, Nossal, Suzanne Cory)
Entrance Exam Preparation
Mathematics and Numerical Reasoning
Exam Preparation Test Paper + Related Work Sheets Every Week
- Teaching year 8 Curriculum for year 6 mid-year students and preparing them for Selective School Entrance Exam
- Year 9 to Year 10 Mathematics
- VCE
General and Further Mathematics Units 1&2, 3&4
Mathematical Methods Units 1&2, 3&4

Janaki Withana BSc Engineer, Grad Dip in Teaching
Secondary/Mathematics - Victoria University
Call 0430 079 772 or (03) 8786 7550